# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2211/50 - 2021 ජනවාරි මස 21 බ්‍රහස්පතින්දා - 2021.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81 (XIII)

### 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වන වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර,
පරිසර අමාත්‍ය.

2021 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2021 අංක 01 දරන ජාතික පාරිසරික (ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනා ගැනීමේ ප්‍රමිති) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නිෂ්පාදිත යම් ප්ලාස්ටික් අයිතමයක්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනාගැනීමේ ප්‍රමිතීන්ට අනුකූලව පැහැදිලිව සළකුණු කරනු ලැබිය යුතු ය.

3. මෙහි උපලේඛනයේ II වන තීරයේ කෙටි යෙදුමෙන් දක්වා ඇති, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් නිෂ්පාදනය කරන ලද ප්ලාස්ටික් අයිතමයක්, එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති විකල්ප සලකුණු තුනෙන් එකක් දරනු ලැබිය යුතු ය.


1A - PG 5277 — 2,525 (2021/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. මේ නියෝගවල -

"ප්ලාස්ටික් අයිතමය" යන්නෙන්, පොලිඑතිලීන්, ටෙරෙප්තලේට්, වැඩි ඝනත්වයකින් යුත් පොලිඑතිලීන්, අඩු ඝනත්වයකින් යුත් පොලිඑතිලීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ්, පොලිප්‍රොපිලින්, පොලිස්ටයිරීන් හෝ වෙනත් යම් සමාන අමුද්‍රව්‍යකින් හෝ ඒවායේ යම් මිශ්‍රණයකින් සාදන ලද යම් නිෂ්පාදනයක් අදහස් වේ.

## උපලේඛනය

[2 වන නියමය]

### ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනාගැනීමේ ප්‍රමිති

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | | |
|---|---|---|---|---|
| *ද්‍රව්‍ය* | *ද්‍රව්‍යයේ කෙටි යෙදුම* | *විකල්ප සලකුණු* | | |
| | | 1 | 2 | 3 |
| (1) පොලිඑතිලීන් ටෙරෙප්තැලේට් | PET හෝ PETE | 01 PET | 1 PETE | 1 |
| (2) වැඩි ඝනත්වයකින් යුත් පොලිඑතිලීන් | HDPE හෝ PE-HD | 02 PE-HD | 2 HDPE | 2 |
| (3) පොලි වයිනයිල් ක්ලෝරයිඩ් | PVC හෝ V | 03 PVC | 3 V | 3 |
| (4) අඩු ඝනත්වයකින් යුත් පොලිඑතිලීන්, රේඛීය අඩු ඝනත්වයකින් යුත් පොලිඑතිලීන්. | LDPE හෝ PE-LD | 04 PE-LD | 4 LDPE | 4 |
| (5) පොලිප්‍රොපිලීන් | PP | 05 PP | 5 PP | 5 |
| (6) පොලිස්ටයිරීන්, ප්‍රසාරික පොලිස්ටයිරීන්, ස්ටයිරොෆෝම් | PS | 06 PS | 6 PS | 6 |
| (7) ඇක්‍රිලික්, නයිලෝන්, පොලිකාබනේට් වැනි අනෙකුත් ප්ලාස්ටික් සහ විවිධ ප්ලාස්ටික්වල බහුස්ථර සංයෝජන | OTHER හෝ O | 07 OTHER | 7 O | 7 |

02 - 15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.